(අ) (i)

විගණකාධිපතිවරයාගේ අංක SC/AU/RMV/MTD/2010/3 හා 2010 ඔක්තෝම්බර් 27 දිනැති **(ඇමුණුම් 01)** විගණන විමසුමෙන් දක්වා ඇති පරිදි ආදායම් අහිමි වීමක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් සිදු කර තොමැත. විගණන වාර්තාවේ මාතෘකාවේ සඳහන් පරිදි දන්වා ඇති කාර්යයන් සිදු කිරීම රේගු දෙපාර්තමේන්තුව, ආනයන අපනයන දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාවට හා පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බැවින් එම ආයතනවලින් කෙරෙන කටයුතු පාලනය කිරීමේ බලයක් **2009 අංක 08 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත** මඟින්, දෙපාර්තමේන්තුවට නොමැත. දැනටමත් ලියාපදිංචි වූ මෝටර් රථවල අංක උපයෝගී කරගෙන ආනයනය කරන ලද වාහන කොටස් මඟින් වාහන බඳ කොටස් එකතු කරමින් මෝටර් රථ සකසා ධාවනය එම දෙපාර්තමේන්තුවට සෘජුව පාලනය කිරීමට අපහසු බැවින් ද මෝටර් රථ ආනයනය හෝ ඒවායේ කොටස් ආනයනයද මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කටයුතු වන බැවින්ද, ඒවා පාලනය කිරීමේ හැකියාවක් නොමැත. එසේ වුවද විගණකාධිපතිවරයාගේ මෙම විගණන විමසුම සම්බන්ධයෙන් වූ කරුණු පිළිබඳව අදාළ ආයතන දැනුවත් කර ඇත.

01. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 09 හා 2010.12.07 දිනැති ලිපියෙන් ආනයන අපනයන පාලක වෙත දන්වා ඇත්තේ වාහන සඳහා බොඩ් ගෙන්වීමට අවසර නොදෙන ලෙසය. **(ඇමුණුම් 02)**

02. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 07 හා 2010.12.07 දිනැති ලිපියෙන් මෙවැනි තත්ත්වයන් සම්බන්ධව සොයාබලා ක්‍රියාකිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස රේගු අධ්‍යක්ෂක ජෙනරාල් වෙත දන්වා ඇත. **(ඇමුණුම් 03)**

03. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 01 හා 2010.12.07 දිනැති ලිපියෙන් ත්‍රිවිධ හමුදාව හා පොලීසිය සතු ගරහිත මෝටර් රථ විසිණීමේදී අළුත්වැඩියාකර පාවිච්චි කිරීමට නොහැකි අඩලන් මෝටර් රථ සුන් බුන් ලෙස විසිණීම සුදුසු බව ලේකම් ආරක්ෂක අමාත්‍යාංශයට දන්වා ඇත. **(ඇමුණුම් 04)**

(ii)

නියමිත රේගු ගාස්තු නොගෙවා ගෙන්වන ලද වාහන සහ වාහන බොඩ් සම්බන්ධව ක්‍රියා කිරීමේ අයිතිය රේගු දෙපාර්තමේන්තුව සහ ආනයන අපනයන පාලක වෙත පැවරෙන අතර, ඒවා පාලනය කිරීමට අවශ්‍යවන පියවරයන් රේගු දෙපාර්තමේන්තුව සහ ආනයන අපනයන දෙපාර්තමේන්තුව විසින් ගත යුතුය. එම කටයුතු පාලනය කිරීමේ අයිතියක් 2009 අංක 08 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මඟින්, කොමසාරිස්වරයාට නොමැත. වංචාවක් සිදුවීම වැලැක්වීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ද ත්‍රිවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ඒවා පහත පරිදි වේ.

01. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/85 /මෝ.පරි.රැස්වීම් හා 2009.03.03 දිනැති ලිපියෙන් 325 කාණ්ඩයේ අංක හිඟක් කිරීම නවතා ඇති බව සියලු ආංශවල මාණ්ඩලික ප්‍රධානීන් හාඅධීක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇත. **(ඇමුණුම් 05)**

02. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/113(II)දෙ.නියෝග හා 2009.12.14 දිනැති ලිපියයෙන් වාහනවල පන්ති පරිවර්තනය හා ඩීසල් මෝටර් රථ පෙට්‍රල් කිරීමටත්, පෙට්‍රල් මෝටර් රථ ඩීසල් කිරීම නවතා ඇති බව අතිරේක/නියෝජන/සහකාර කොමසාරිස්වරු හා මෝටර් රථ පරීක්ෂක/අධීක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇත. **(ඇමුණුම් 06)**

(iii)

විගණන විමසුමේ රජයට රුපියල් මිලියන 6400 ක ආදායම් අහිමිවීම් පිළිබඳ දක්වා ඇත්තේ

- නියමිත රේගු ගාස්තු නොගෙවීම
- බොඩ් ගෙන්වීමේ අවසරය යටතේ ගෙන්වන ලද බොඩ් සඳහා පැරණි අංක යටතේ වූ වාහන වෙනුවෙන් වැසි අංක කොටා එම පැරණි අංක යටතේ වාහන ධාවනය කිරීම
- වනප ලිපි ලේඛණ මත මෝටර් රථ ලියා පදිංචි කිරීම නිසා

බව වන අතර, මෙම කටයුතු මෝටර් රථ දෙපාර්තමේන්තුවට පමණක් පාලනය කළ නොහැකි බැවින්, උක්ත කටයුතු සිදු කර ඇති පුද්ගලයන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 10 හා 2010.12.07 දිනැති ලිපියෙන් අධ්‍යක්ෂක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත.

(ආ)

ඉහත වංචනික ක්‍රියා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගෙන ඇත. එය පහත පරිදි වේ.

1. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 10 හා 2010.12.07 දිනැති ලිපියයෙන් වංචනික ක්‍රියා සිදු කර ඇති නිලධාරීන්/ නිලධාරණියන් පිළිබඳව පරීක්ෂාකර බලා නීතිමය කටයුතු සිදු කරන ලෙස අධ්‍යක්ෂක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා ඇත. **(ඇමුණුම් 07)**
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 12 හා 2010.12.17 දිනැති ලිපියයෙන් වංචනික ක්‍රියා සිදු කොට ලියාපදිංචි කර ඇති මෝටර් රථ ධාවනයේ ඇත්නම් ඒ පිළිබඳ පරීක්ෂාකර බලා නීතිමය පියවර ගන්නා ලෙස අධ්‍යක්ෂක රථ වාහන පොලීසියට දන්වා ඇත. **(ඇමුණුම් 08)**
3. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අංක DMT/COM/196/AU/2010 - 11 හා 2010.12.17 දිනැති ලිපියයෙන් රජයේ රස පරීක්ෂකතුමාව ද දැනුවත් කර ඇත්තේ එවැනි වංචනික ක්‍රියා සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙසය. **(ඇමුණුම් 09)**

ඒ සම්බන්ධව පරීක්ෂණ වාර්තාවක් මේ දක්වා නොලැබුණු අතර, එසේ ලැබුනු විගාම අදාළ ආයතන නිලධාරීන්/නිලධාරණියන් වෙනුවෙන් නීතානුකූලව/විනයානුකූලව කටයුතු කිරීම සඳහා ක්‍රියා කරනු ඇත.

(ඇ) අදාළ නොවේ